NCP/CS/ED/11/3-1

2024.03. 25

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 03/2024

සියළුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සහ

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට එරෙහිව පවතින විනය කටයුතු කඩිනම් කිරීම

පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් සම්බන්ධයෙන් පැවැත්වෙන මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ කටයුතු සැළකිය යුතු ලෙස ප්‍රමාදවීම් සිදුවන බවට විනය පරීක්ෂණ කාර්තු වාර්තා පරීක්ෂා කර බැලීමේදී නිරීක්ෂණය වන අතර විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින්ද මේ පිළිබඳව විමසීම් කර ඇත.

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය අනුව යම් සිද්ධියක් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා මූලික විමර්ශන කමිටුවක් හෝ නිලධාරියෙකු පත් කිරීමේදී එම විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත අවසන් කල යුතුද යන්න අනිවාර්යයෙන්ම නියම කළ යුතු අතර එළෙස නිශ්චිතව නියම කරනු ලැබූ කාල සීමාව ඇතුළත එම මූලික විමර්ශනය නිම කිරීමට පිළිගත හැකි ආකාරයේ බාධාවන් ඇතිවන බව මූලික විමර්ශන නිලධාරියා විසින් හේතු සාධක සහිතව තහවුරු කරන කල්හි අදාළ බලධාරියා විසින් අවස්ථානෝචිතව සුදුසු පමණට කාලය දීර්ඝ කල හැකිවුවද සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශ්වයක්ම නිරන්තරයෙන් වගබලා ගත යුතුය.

එසේම , විනය පරීක්ෂණ කාර්තු වාර්තා පරීක්ෂා කර බැලීමේදී සමහර ආයතන වල වාහන අනතුරු හා දේපළ නැතිවීම් හා හානිවීම් සම්බන්ධ මු.රෙ.104 පරීක්ෂණ හා වෙනත් සිද්ධි සම්බන්ධයෙන් නිලධාරීන්ට එරෙහිව පැවැත්වෙන මූලික විමර්ශන වසර ගණන් අවසන් නොවී පරීක්ෂණ කටයුතු අක්‍රියව පවතින බව නිරීක්ෂණයවේ.

මෙය ඉතාම අහිතකර තත්වයක් වන අතර මෙලෙස නියමිත කාලසීමාව තුළ පරීක්ෂණ කටයුතු අවසන් නොවීම හේතුවෙන් තොරතුරු හා සාක්ෂි අස්ථානගතවීම, සාක්ෂිකරුවන් ප්‍රකාශ ලබාදීම සඳහා ඉදිරිපත් නොවීම, හා සත්‍ය වසන් කිරීම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගැනීම වැනි හේතු පරීක්ෂණ කටයුතු වලට දැඩි බලපෑමක් එල්ල කරන අතර සත්‍ය කරුණු හෙළි නොවීම මත වැරදි සිදු කරන ලද පුද්ගලයින් ඉන් නිදහස්වීමටත් රජයට හා රජයේ දේපළ වලට සිදුවූ හානි හෝ පාඩු ප්‍රතිපූර්ණය කර ගැනිමට නොහැකි වන අවස්ථාත් පසුගිය කාලසීමාව තුළ නිරීක්ෂණයවී ඇත.

එබැවින් මෙම තත්වය ඉදිරියට ඇතිවීම වලක්වා ගැනිම සඳහා පහත සඳහන් උපදෙස් තරයේ පිළිපදින ලෙසත් එම උපදෙස් පරිදි කටයුතු නොකරන නිලධාරින් සම්බන්ධයෙන් දැඩි විනය ක්‍රියා මාර්ග ගන්නා ලෙසට මෙයින් දැනුම් දෙමි.

I. වාහනයක් අනතුරකට ලක්වීම , යම් රජයේ දේපලකට හානියක් සිදුවීම , හෝ දේපල හෝ භාණ්ඩ අස්ථානගතවීමක් සිදුවී ඇති බවට වාර්තා වූ වහාම ඒ සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කර දින 07 ක් ගතවීමට පෙර මු.රෙ. 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තාවක් ප්‍රධාන ලේකම් හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට පිටපත් සහිතව විගණකාධිපති වෙත වාර්තා කළ යුතුය. (පළාත් මුල්‍ය රීති රී 54.5 සහ 54.6 හි දක්වා ඇති පරිදි )

II. සිද්ධිය සිදුවී මාස 03 ක් ගතවීමට පෙර සිදුවූ අනතුර හා හානිය සම්බන්ධයෙන් අවසන් වාර්තාව ඉහත I හි දැක්වෙන පරිදි මු.රෙ.104 අනුව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.(පළාත් මුල්‍ය රීති 54.6 හි දක්වා ඇති පරිදි )

III. ඉහත I හි සඳහන් අනතුර හා හානිය යම් නිලධාරියෙකු හෝ කීප දෙනෙකුගේ අනවධානය , රාජකාරී පැහැර හැරීම හා වරදකින් සිදුවී ඇති බවට මු.රෙ.104 පරීක්ෂණයේදී අනාවරණය වුවහොත් අදාළ නිලධාරියා / නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සඳහා ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය අනුව වහාම මූලික විමර්ශනයක් පැවැත්වීමට කටයුතු කල යුතුයි.

IV. යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු අතින් සිදුවන වැරදි , වංචා හා රාජකාරී පැහැර හැරීම හෝ විනය විරෝධී ක්‍රියාවන් සිදුවී ඇති බවට වාර්තා වූ වහාම ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා සුදුසු නිලධාරියෙකු හෝ කමිටුවක් පත් කිරීමට අදාළ බලධාරීන් කටයුතු කල යුතුයි.

V. එලෙස පත්කිරීම සිදු කිරීමේදී එකී පරිච්ඡේදයේ 13: 2 උප වගන්තියේ අනුව විමර්ශන කටයතු කොපමණ කාල සීමාවක් තුළ අවසන් කල යුතුද යන්න (විමර්ශන වාර්තාව භාරදිය යුතු දිනය) අදාළ පත් කිරීමේ ලිපියේ අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

VI. ඉහත V හි දැක්වෙන පරිදි එලෙස නියම කරනු ලබන කාලසීමාව තුළ පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කල හොත් පමණක් අදාළ කාලසීමාව අවස්ථානෝචිත පරිදි යම් සාධාරණ කාලසීමාවකින් දීර්ඝ කිරීමට අදාළ බලධාරීන් කටයුතු කල යුතු අතර එලෙස දීර්ඝ කරනු ලබන කාල සීමාව ඉක්මවා යාමට ප්‍රථම මූලික විමර්ශනය අවසන් කර විමර්ශන වාර්තාව ඉදිරිපත් කල යුතු බවට මූලික විමර්ශන නිලධාරිට හෝ කමිටුවට දැනුම්දීමට කටයුතු කළ යුතුය.

VII. එසේම, මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා පත් කරනු ග ලබන නිලධාරීන්ට අදාළ කාර්යය තම රාජකාරියේම කොටසක් වන බවත් ඒ සඳහා ප්‍රමුඛ අවධානය යොමු කර නියමිත කාලසීමාව ඉක්මවීමට පෙර විධිමත් පරිදි මූලික විමර්ශනය පවත්වා විමර්ශන වාර්තාව ඉදිරිපත් කල යුතු බව අදාළ පත්කිරීමේ ලිපියේ සඳහන් කල යුතුය.

VIII. මූලික විමර්ශනය පැවැත්වීම සඳහා පත් කරනු ලබන නිලධාරියාට අදාළ කාර්ය ප්‍රමුඛ රාජකාරියක් සේ සළකා කටයුතු කිරීමට හැකිවන පරිදි රාජකාරී නිවාඩු ලබාදී ඔවුන් ඒ සඳහා නිදහස් කිරීමට සියළුම ආයතන ප්‍රධානීන් කටයුතු කළයුතු අතර අවශ්‍ය පහසුකම් සපයාදිය යුතුය. මූලික විමර්ශණය පැවැත්වීම සඳහා එම අවස්ථාවේ පැමිණෙන නිලධාරීන් සඳහා පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සියළුම පහසුකම් හා සහයෝගය ලබාදීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.

IX. මූලික විමර්ශන කටයුතු අවසන් කර අඩුපාඩු රහිතව විමර්ශන වාර්තාව භාරදුන් නිලධාරීන්ට ඒ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2014 හි සඳහන් පරිදි දීමනා ගෙවීමට නොපමාව කටයුතු කල යුතු අතර ඊට අමතරව සති අන්ත හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින වල විමර්ශන කටයුතු වල නිරතවී ඇත්නම් එකී කාලසීමාව සඳහා ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන අනුව අතිකාල දීමනා හෝ නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු කල යුතුය. මෙම ගෙවීම අදාළ නිලධාරීන්ගේ මාසික අතිකාල හා නිවාඩු දින ගණන් සීමාවට යටත් නොවන අතර විශේෂ රාජකාරියක් ලෙස සළකා අදාළ ගෙවීම සිදු කිරීමට කටයුතු කල යුතුය.

X. මූලික විමර්ශනය පැවැත්වීම සඳහා පවරනු ලබන නිලධාරීන්ට කිසිදු හේතුවක් මත එම වගකීම ඉටුකිරීම ප්‍රතික්ෂේප කිරීමට හැකියාවක් නොමැත. කෙසේ වුවද සුවිශේෂිවූ හේතුවක් මත එලෙස විමර්ශන කටයුතු වලින් ඉවත් කරන ලෙස ඉල්ලීමක් තම ආයතන ප්‍රධානියගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇති විටක පමණක් එම නිලධාරින් මූලික විමර්ශන කටයුතු වලින් නිදහස් කර කඩිනමින් වෙනත් නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය.

XI. ඉහත X හි සඳහන් පරිදි පිළිගත හැකි සාධාරණ හේතුවක් නොමැතිව මූලික විමර්ශන කටයුතු ප්‍රතික්ෂේප කිරීම හා එම වගකීම නිසි පරිදි ඉටු නොකිරීම ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ රජයේ නිලධාරීන් විසින් සිදු කල හැකි වරදවල් සම්බන්ධයෙන් පළමු වන උප ලේඛණයේ අනු අංක 14 හා 15 යටතට ගැනෙන බරපතල වරදවල් වන බැවින් එවැනි නිලධාරීන්ට එරෙහිව වහාම විනයානුකූලව කටයුතු කිරීම සඳහා අදාළ විනය බලධාරියාට දැනුම්දීමට කටයුතු කළ යුතුයි.

XII. මූලික විමර්ශනය අවසන් කර , විමර්ශන වාර්තාව තමන් වෙත ලැබී මසක් ගතවීමට ප්‍රථම , විමර්ශනයේදී වංචාවක් හෝ අක්‍රමිකතාවයක් හෝ රාජකාරි පැහැර හැරීමක් අනාවරණය නොවන්නේ නම් විමර්ශන කටයුතු අවසන් කිරීම නොඑසේනම් හෝ ලඝු විනය ක්‍රියාමාර්ග ගැනීමට හෝ යම් අක්‍රමිකතාවයක් සිදුවී ඇති බවට කරුණු අනාවරණය වී ඇත්නම් වගකිව යුතු නිලධාරීන්ට, එරෙහිව චෝදනාපත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට වහාම කටයුතු ආරම්භ කල යුතුයි.

XIII. එලෙස පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂන සඳහා ඒක පුද්ගල විනිශ්චය සභා , පැමිණිල්ල මෙහෙයවන නිලධාරී , හෝ රැකවරණ නිලධාරී ලෙස පත් කරනු ලබන නිලධාරීන්ට ඒ සඳහා සහභාගී වීමට රාජකාරි නිවාඩු හා ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව අනෙකුත් පහසුකම් සපයාදීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුයි.

XIV. විධිමත් විනය පරීක්ෂණ අවසන් කර සම්පිණ්ඩන වාර්තා හා/හෝ පරීක්ෂණ වාර්තා නිවැරදිව භාරදුන් පසු අදාළ නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2018 අනුව අදාළ දීමනා ප්‍රමාදයකින් තොරව ගෙවීම් සිදුකිරීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය.

XV. එසේම විධිමත් විනය පරීක්ෂණය අවසන් කර විමර්ශන වාර්තා ලැබී මසක් ඉක්මවායාමට පෙර ඒ සඳහා සුදුසු විනය නියෝග ලබාදීමට සියළුම විනය බලධාරීන් කටයුතු කල යුතු අතර එළෙස ලබාදෙන විනය නියෝග වලට එරෙහිව චූදිත නිලධාරීන් විසින් නියමිත කාලය තුළ ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම 01/2019 හි 2 වන උපලේඛනයේ දැක්වෙන පරිදි නිසි අභියාචනා බලධාරියා වෙත අදාළ ලිපි ලේඛන සමඟ නොපමාව ඉදිරිපත් කිරීමට විනය බලධාරීන් කටයුතු කල යුතුය.

මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් තරයේ පිළිපදින ලෙසත් ඔබ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන වල ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් , පවතින විනය කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුවන බවට විටින් විට පරීක්ෂා කර බලා අවශ්‍ය උපදෙස් හා පිළියම් යෙදීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීම වන බවද අවධාරණය කරමි.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්
උතුරු මැද පළාත

O/C

පිටපත් :-

01. ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය ,
උතුරු මැද පළාත
- ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා

02. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත - දැ.පි.

03. සහකාර විගණකාධිපති , ජාතික විගණන උප කාර්යාලය - දැ.පි.

04. ප්‍රධාන අභ්‍යන්තර විගණක ,
පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත - දැ.පි.